කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී උපාධි දෙවන වසර පරීක්ෂණය

දෙවන සෙමෙස්තරය - 2022/2023

# BST 2226 – සාහිත්‍ය මූලාශ්‍රය හා බෞද්ධ සම්ප්‍රදාය II

(පැ දෙකයි)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

---

1. ලාංකික ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය හා එහි විකාශනය අධ්‍යයනය කිරීමෙහිලා සම්භාව්‍ය සිංහල සාහිත්‍යයෙහි මූලාශ්‍රයමය අදාළත්වය විමර්ශනය කරන්න.

2. බුද්ධ වචනය අර්ථ විවරණයෙහිලා සම්භාව්‍ය සිංහල ගත් කතුවරුන් විසින් දරන ලද ප්‍රයත්නය කොතෙක් දුරට සාර්ථක වී තිබේද යන්න ව්‍යාඛ්‍යාන සාහිත්‍යය ඇසුරෙන් සාකච්ඡා කරන්න.

3. ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය කෙරෙහි හින්දු ආගමික දේව සංකල්පයේ බලපෑම පිළිබඳ අවධානය යොමු කරමින්, ඒ සම්බන්ධයෙන් ථෙරවාද බෞද්ධයන් දැක් වූ ප්‍රතිචාරය සසදාවත හා බුදුගුණාලංකාරය නිදසුන් කොට ගනිමින් පැහැදිලි කරන්න.

4. මධ්‍යතන යුගයේ ගිහි බෞද්ධ ආගමික චරණය කෙරෙහි පූජාවලියේ බලපෑම පරීක්ෂා කරමින් ආමිස හා ප්‍රතිපත්ති පූජා පිළිබඳ මයුරපාද හිමියන්ගේ අර්ථ විවරණය කෙබඳුදැයි විග්‍රහ කරන්න.

5. බෞද්ධ ආගමික සංකේත හා සම්බන්ධ පූජා චාරිත්‍ර නිර්මාණයෙහිලා වංශ කථා සාහිත්‍යයේ දායකත්වය සිංහල බෝධිවංශය ඇසුරෙන් තහවුරු කරන්න.

6. සිංහල සම්භාව්‍ය ග්‍රන්ථ රචකයන්ට ජාතක කථා මගින් වස්තුබීජ සැපයුණු ආකාරය පැහැදිලි කොට පුද්ගල හා සමාජීය සදාචාරය ගොඩ නැගීමෙහිලා පන්සිය පණස් ජාතක පොත උපස්ථම්භක වූ අයුරු නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

******************************